C
398.4
DIS

# කඩවර ශාන්තිකර්මය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# A RESERCH STUDY ON "KADAWARA SHANTHI KARMAYA"

ඩී. එම්. ඩබ්. කේ. දිසානායක

මෙම ස්වාධීන නිබන්ධය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි

වර්ෂය : 2002
M/Phil/94/44
විභාග අංක : 446
සිංහල අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

553992

## සංක්ෂිප්තය

ලක්දිව දකුණු පළාතේ රටයකුම හෙවත් රිද්දි යාගය, හා කළුකුමාර සමයම, සබරගමු පළාතේ කුමාර සමයම, තත් ප්‍රදේශවලට සීමාවූ ගර්භ සංරක්ෂණික ශාන්තිකර්ම වේ. කඩවර යක් කංකාරිය ශ්‍රී ලංකාවේ උඩරට යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයට සුවිශේෂ වූ ගර්භ සංරක්ෂණික ශාන්තිකර්මයයි. එයිනුත් මධ්‍යම, වයඹ, උතුරු මැද යන පළාත්වලට මෙය සීමා වේ. වයඹ, උතුරුමැද, පළාත්වලට වඩා මෙකී යක් කංකාරිය අංග සම්පූර්ණව සව්රාත්‍රිකව පවත්වන්නේ මධ්‍යම පළාතේ මාතලේ දිසාවෙහි ය. එබැවින් පර්යේෂණ ප්‍රදේශය වශයෙන් උක්ත ප්‍රදේශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කලෙමි. මෙම ප්‍රදේශවල වැසි ජනතාවගේ ඇදහිලි, විශ්වාස, ආකල්ප, සාරධර්ම ඇසුරින් ප්‍රභවය ලැබූ මෙම ශාන්තිකර්මය දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ගේ ඕනෑ එපාකම් සපුරමින් පැවතුණ ද අද දක්වාත් මේ පිළිබඳව පරිපූර්ණ පර්යේෂණයක් සිදු කොට නොමැත.

කඩවර විශේෂයෙන්ම ස්ත්‍රීන් හා සම්බන්ධ වූ යක් කංකාරියකි. කඩවර විවාහක කාන්තාවන්ගේ දරු ගැබ් විනාශ කිරීමත්, දරුගැබ් ඇතිවීම වැළැක්වීමත්, ඇවිලීම වෙව්ලීම, දොඩවීම, තුන්ජාමයට වෙව්ලා උණ ගැනීම, ලේමාල, කිලිමාල වැනි ස්ත්‍රීන් විෂයෙහි විවිධ රෝගී තත්ත්වයන් ඇති කරන බවත් උක්ත ප්‍රදේශවල වැසියෝ තදින් ම විශ්වාස කරති. එකී රෝගවලින් කාන්තාවන් නිදහස් කර ගැනීම සඳහා කඩවර යක් කංකාරියක් පවත්වා කඩවරට පුද පූජා, දොළ පිදේනි පිදිය යුතු බවත් ඉන් පසුව එකී රෝග නිවාරණය වන බවත් ඔවුහු විශ්වාස කරති.

1. කොහොඹා යක් කංකාරිය
2. බලියාග ශාන්තිකර්මය
3. වලියක් මංගල්ලය
4. අඩුක්කු පූජාව
5. කිරි අම්මාවරු දානේ

UNIVERSITY OF PERADENI
12-12-2002
LIBRARY.

6. ගම්මඩු පූජාව

යනාදි ශාන්තිකර්ම හා යාතුකර්ම රාශියක් තත් ප්‍රදේශවලට ආවේණිකව පවතී.

මෙකී ශාන්තිකර්මවලින් කොහොඹා යක් කංකාරිය, බලියාග ශාන්තිකර්මය, කිරිඅම්මාවරු දානේ, ගම්මඩු පූජාව, සොකරි නැටුම යනාදිය ගැන පර්යේෂණ සිදු කොට, පතපොත පලකොට ඇති නමුත් කඩවර යක් කංකාරිය ඈත අතීතයේ සිට අද දක්වාම තත් ප්‍රදේශවල පැවතුණ ද ඒ සම්බන්ධයෙන් විස්තරාත්මක පර්යේෂණයක් සිදු කොට නැත. ලක්දිව ශාන්තිකර්ම (rituals) පවත්වන රටාව මීට හේතු වන්නට ඇත. යාතුකර්ම (rituals) පුද පූජා ලබන ආකාරය අනුව කොටස් හතරකට බෙදිය හැකි ය.

1. දේව ගණයට අයත් යාතුකර්ම
2. යක්ෂ/රාක්ෂස ගණයට අයත් යාතුකර්ම
3. නව ග්‍රහ සම්බන්ධ යාතුකර්ම
4. ප්‍රේත කොට්ඨාය සම්බන්ධ යාතුකර්ම

මෙයින් කඩවර යක් කංකාරිය දෙවන කොටසට අයත් යාතුකර්මයකි. ඒ අනුව කඩවර යක්ෂ/දේව යන දෙකොටසටම අයත් අන්තරාවර්තිත දෙවි කෙනෙකි. මහා සම්ප්‍රදායට අයත් දේව/යක්ෂ ගණයා සම්බන්ධව පැවත්වෙන යාතුකර්ම ගැන බොහෝ දෙනාගේ අවධානය යොමු වුවද කඩවර වැනි චූල සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයක් ගැන එතරම් අවධානයක් යොමු කොට නැත. එබැවින් මෙම ඉපැරණි සංස්කෘතිකාංගය තාක්ෂණයෙන් හා විද්‍යාවෙන් දියුණු නූතන සමාජයෙන් ඉවත් වී යාමට එතරම් කලක් ගත නොවනු ඇත. එවැනි තත්ත්වයක් මත කඩවර යක් කංකාරිය ගැන විස්තරාත්මක පර්යේෂණයක් කිරීම කාලෝචිත යැයි මම සිතමි.

අරමුණු

- කඩවර දෙවි/යක් යන නම්වලින් හැඳින්වෙන කඩවර විෂයයෙහි පවත්වන කඩවර ශාන්තිකර්මය පිළිබඳ විස්තරාත්මක පර්යේෂණයක් කිරීම මෙහි මූලික අරමුණයි. එහිදී
- කඩවර නාමය, කඩවර උපත, විකාශය සම්බන්ධ පර්යේෂණ කිරීම.
- ශාන්තිකර්මය පැවැත්වීමේ පරමාර්ථ සෙවීම.
- කඩවර ශාන්තිකර්මයෙහි පූජා විධි රටාව හා එහි ව්‍යුහය පිළිබඳ විධිමත් අධ්‍යයනයක් කිරීම.
- යකැදුරන්, ගුරුන්නාන්සේලා වාචිකව රැකගෙන එන ශාන්තිකර්මයට සම්බන්ධ විස්තර එක්රැස් කිරීම.

එසේ ම නවීකරණයේ ප්‍රතිඵල මත ඇතිවන භෞතික හා චින්තනමය වෙනස්වීම් හමුවේ මෙකී යාතුකර්මවල ඇති වැදගත්කම සොයා බැලීම වැනි අරමුණු රාශියක් මේ සඳහා පාදක වී ඇති බව සඳහන් කළ හැකි ය.

උක්ත අරමුණුවලට අනුව මෙකී නිබන්ධයේ අන්තර්ගතය සකස් කොට ඇත. ඒ අනුව පළමුවන පරිච්ඡේදය ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වා ඇත. ඉන් පළමුවැන්නෙන් මාතලේ දිසාවේ පොදු පූජා විධි රටාව පිළිබඳ විමසුමක්ද, දෙවැන්නෙන් උක්ත ප්‍රදේශය පුරා ගර්භ සංරක්ෂණය අරබයා පවත්වන වත් පිළිවෙත් පුද පූජා පිළිබඳ විමසුමක් ද තෙවැන්නෙන් ප්‍රධාන ගර්භ සංරක්ෂණ පූජාව වූ "කඩවර යක් කංකාරිය" මධ්‍යම පළාතේ මාතලේ දිසාවේ අංග සම්පූර්ණව සර්වරාත්‍රිකව සිදුකරන අයුරුත් එම ශාන්තිකර්මයම වයඹ, උතුරුමැද පළාත්වල කාල, භාග ආදි වශයෙන් පවත්වන අයුරුත් සන්සන්දනාත්මකව විමර්ශනයට භාජනය කළෙමි. තවද කඩවර දෙවි, යක් සංකල්ප පිළිබඳ අර්ථ දක්වා කඩවර යක් කංකාරිය හැඳින්වෙන විවිධ නාම විග්‍රහයක්ද මෙහිදී සිදු කළෙමි.

දෙවන පරිච්ඡේදයේදී කඩවර යක් කංකාරියට අදාල පූජාවිධි රටාව ඉතා නිවැරදිවත්, ක්‍රමානුකූලවත් ඉදිරිපත් කලෙමි. එහිදී මා පෞද්ගලිකවම සව්රාත්‍රිකව නැරඹූ කඩවර යක් කංකාරි පහක් තෝරාගෙන එයිනුත් වඩාත් නිවැරදිව මෙන්ම පිළිවෙලට ඉදිරිපත් කළ කඨන්දැමේ පරණගම්කොටුවට අයත් ඇටඹුරේ නම්වූ පැරණි ග්‍රාමයේ පැවති කඩවර යක් කංකාරියට අයත් පූජාවිධි රටාව ආදර්ශ ඒකකය වශයෙන් ගෙන ඉදිරිපත් කොට ඇත.

කඩවර යක් කංකාරියේදී පුද පූජා ලබන දෙවි/යක් කොටස් තෝරාගෙන ඒ පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් කිරීමට තෙවන පරිච්ඡේදය වෙන් කලෙමි. එහිදී කඩවරගේ උපත, විකාශය, ප්‍රමාණය යනාදි කරුණු ගැන මෙන්ම ලක්දිව කඩවරගේ ව්‍යාප්තියේ ස්වභාවයද, කඩවර යක් කංකාරියේදී පුද ලබන ඉරුගල් බණ්ඩාර දෙවි, රීරි, තොට, රති, දළ යනාදි කඩවර යකුන් පිළිබඳවද විග්‍රහාත්මක විමර්ශනයක් සිදුකොට ඇත.කඩවර යක් කංකාරියට අදාල යක්කම් පෙළපාළි හත වන කපු යක්කම, පත් යක්කම, නයි යක්කම, වැදි යක්කම, දරු යක්කම, බොරු යක්කම හා මහ යක්කම යන යක්කම් පෙළපාළි වෙනුවෙන් මෙහි සිවුවන පරිච්ඡේදය වෙන් වේ. එහිදී උඩරට කොහොඹා කංකාරියට අදාල යක්කම්ද පහතරට රටයකුම හෝ රිද්දි යාගයට අයත් යක්කම් යන යක්කම් පිළිබඳ අවධානය යොමු කළ අතරම උඩරට කඩවර යක් කංකාරියට අයත් යක්කම් හා උක්ත කංකාරිවලට අයත් යක්කම් අතර පවත්නා සම විෂමතාද සාකච්ඡාවට භාජනය කලෙමි. එමෙන්ම උඩැක්කි, තංතිරි, වේණා, නැටීම් ඇතුළත් මහ යක්කමෙන් නිමාව දකින යක්කම් පෙළපාළි රඟ දැක්වීම තුළින්ම නිමාව දකින ආතුර මානසිකත්වය ගැනද එහිදී අවධාරණය කලෙමි.

කඩවර යක් කංකාරිය උඩරට පවත්වන සෙසු ශාන්ති කර්මවලට වඩා සැබැවින්ම ප්‍රතිඵලදායක ශාන්ති කර්මයක් බව නිදසුන් සහිතව සනාථ කරන සමාලෝචනයෙන් මෙම පර්යේෂණ නිබන්ධය නිමා කොට ඇත.

*Abstract*

"Riddiyagaya" or " Ratayakuma" and " Kalukumara Samayama" of Southern Province and " Kumara Samayama" of Sabaragamuwa Province are rituals of embryo protection in the respective provinces of Sri Lanka. Kadawara yak Kankariya is a embryo protection fertility ritual performed specially in the Kandyan provinces or the up-country region of Sri Lanka.

Even among these provinces, this ritual is restricted to the Central, North- western and North- Central Provinces. Only in the Matale region of the Central province could this ritual be found to be celebrated by all night ceremonies, As a result, I have focussed special attention on this area as the area pertaining to the research study. This ritual, begotten from the observations, beliefs, attitudes and morals of the inhabitants of these provinces has been for a long period of time, serving the necessary ritualistic lacuna connected to the protection of the baby in the womb. Nonetheless, no research study has been done to date to record and assess the utility of the ritual.

Kadawara is a Special fertility ritual connected with women of Childbearing age. The demon-deity Kadawara is believed to cause sicknesses related to women and they include lapses in conceivements, abortions, convulsions, fever and related illnesses of the menstrual circle.

To free and save women from the sicknesses of the above kind, it is believed, by the inhabitants of these areas, that they should appease the demon- deity kadawara by holding an all night ritual with offerings. In order to get rid of the sicknesses caused this has been a must in the villages.

The following are the several rites and rituals endemic to the respective provinces mentioned base in: They are:

01. Kohomba Yak Kankariya
02. Baliyaga Shanthikarmaya
03. Waliyak Mangallaya
04. Addukku Poojawa

05. Kiri Ammawarunge Dhanaya
06. Gammadu Poojawa.

So far, no detailed research study was undertaken on the long established "Kadawara Yak Kankariya" although many a research was done and published on rituals like "Kohomba Yak Kankariya", "Baliyaga Shanthikarmaya", " Kiri Ammawarunge Dhanaya", " Gammadu Poojawa" and "Sokari Natuma".

The system enjoined with macro and micro ritualistic celebrations may be the cause for these lapses. It is possible to categorize rites and rituals in Sri Lanka under four sub-headings:

01. Rites and Rituals of Deities
02. Rites and Rituals of Demons and Devils.
03. Rites and Rituals of the Nine Planets
04. Rites and Rituals of Lower Spirits (Prethas)

Kadawara Yak Kankariya belongs to the second category of these rites and rituals. Based on this evidence, Kadawara can be classed as an inter-transformable spirit belonging to both Deities and Demons.

Although much attention has been focussed on the major traditions of demon- deity rituals, little interest was shown on rituals like " Kadawara" linked to the minor ritualistic tradition.

Cultural features of this nature will soon be extinct from the technologically sophisticated society of today unless they are researched, recorded and published. And I consider it a timely act to research on a subject like " Kadawara Yak Kankariya".